**කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සිව්වන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය- 2016/17**

**SOC 4272 - සංවර්ධනය පිළිබඳ සමාජ විද්‍යාව**

**පැ දෙකයි (02)**

**ඕනෑම ප්‍රශ්න තුනකට (03) පිළිතුරු සපයන්න**

---

1. 'කිසියම් රටක ඒක පුද්ගල ආදායම එම රටේ සංවර්ධනය පිළිබඳ නිරවද්‍ය පිළිබිඹුවකි.' අමර්ත්‍ය සෙන්ගේ අදහස් කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

2. 'තුන්වන ලෝකයේ සංවර්ධන මට්ටම ධනවාදී ගෝලීය ප්‍රවණතාවල ප්‍රතිඵල මත රඳා පවතී.' යැපුම් න්‍යාය සහ ලෝක පද්ධති න්‍යාය කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විචාරාත්මකව සාකච්ඡා කරන්න.

3. 'නවීකරණ න්‍යාය සංවර්ධනය බහුමානීය සංසිද්ධියක් ලෙස දකී.' මෙම ප්‍රකාශය උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

4. 'මීතොටමුල්ලේ කුණු කන්ද කඩා වැටීමත් සමඟ ශ්‍රී ලංකාව තුළ කසළ කළමණාකරණය ගැන අවධානය යොමු වන්නට පටන් ගැණුන ද මානව ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස ඇති වන එවැනි ආපදා ඉන් බොහෝ ඔබ්බට දිවෙන 'තිරසාර සංවර්ධනය' පිළිබඳ ගැඹුරු සාකච්ඡාවකට සම්බන්ධ වේ.' මෙම ප්‍රකාශය විචාරාත්මකව විභාග කරන්න.

5. 'ගෝලීයකරණය සංවර්ධනය වෙමින් පවත්නා රටවලට ප්‍රතික්ෂේප කළ නොහැකි ප්‍රවාහයක් බවට පත් වී ඇත්තේ එම රටවල පුරවැසියන් නිරන්තරයෙන් තම අවශ්‍යතා සංවර්ධිත රටවල පුද්ගලයින්ට සාපේක්ෂව තෘප්ත කරගැනීමට උත්සාහ දැරීම නිසාය.' ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? සුදුසු න්‍යායාත්මක අදහස් කෙරෙහි අවධානය යොමු කරමින් හේතු දක්වන්න.

6. කිසියම් සමාජයක ස්ත්‍රීන් බලගැන්වීම එම රටේ සංවර්ධනය කෙරෙහි ධනාත්මකව බලපාන්නේද? සමාජයීය සහ ආර්ථික යන දෙඅංශය තුළම ස්ත්‍රීන්ගේ දායකත්වයේ ඇති වැදගත්කම අගයමින් ඔබගේ අදහස් ඉදිරිපත් කරන්න.

**************************************